**#mediaethicsSL#lka#SinhalaPress#Lankadeepa#Divaina#Rivira#Lakbima#Mawbima#January04**

ප්‍රවෘත්තියක් වාර්තා කිරීමේ දී එහි අන්තර්ගත කරුණු වල නිරවද්‍යතාවය යනු අනිවාර්යයෙන් රැකිය යුතු කාරණයක් මෙන්ම මාධ්‍ය ආචාර ධර්මයක් ද වේ. මෙහිදී එම ප්‍රවෘත්තියේ හෝ විශේෂාංග ලිපියේ හෝ අන්තර්ගත වන කරුණු කාරණාවන් සහ දත්ත නිවැරදි බවට මනා පරීක්ෂාවකින් තහවුරු කර ගැනීමත්, ඒ සඳහා නිවැරදි මූලාශ්‍රයන් භාවිතා කිරීමත් අත්‍යවශ්‍ය වන්නේ ඒ නිසාවෙනි.

බැඳුම්කර කොමිසමට අනුව රජයට සිදු වූ පාඩුව නැති නම් පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගමට වූ ලාභය සම්බන්ධයෙන් පළ කරන්නට යෙදුණු වාර්තාවන් තුළ සඳහන් වූ මුදල් ප්‍රමාණය එකිනෙකට පරස්පර විරෝධී වූ බව නිරීක්ෂණය කරන්නට හැකි විණි. මෙයට හේතුව වන්නේ එකිනෙකට වෙනස් මූලාශ්‍රයන් ඔස්සේ එකිනෙකට වෙනස් දත්ත ලබා ලබා ගැනීම ද? මිලියන සහ කෝටි යන යෙදුම් වලින් නිරූපණය වන සංඛ්‍යාවන් පටලවා ගැනීම ද? එසේත් නැතිනම් මේ හුදු ප්‍රමාද දෝෂයන් ද? අප ප්‍රශ්න කර සිටින්නේ එය යි .